**CEYLINCO GENERAL INSURANCE LIMITED** PB 5184
**Miscellaneous Department**
3rd Floor, " Ceylinco House", 69, Janadhipathi Mawatha, Colombo 1, Sri Lanka.
Tel: +94 11 2485719 (Direct), +94 11 4702702 (General)    Fax: +94 11 4702719
E mail: ciccoms@ceyins.lk

CEYLINCO
VIP
ON THE SPOT
ලෝකෙටම එකයි!

## පෞද්ගලික අනතුරු (අහඹු) රක්‍ෂණ ඔප්පුව CO0116AP0005463

මෙහි ඇති උපලේඛනයේ රක්ෂිතයා යැයි නම සඳහන් අය මෙම ගිවිසුමට පදනම් වන්නාවූත් මෙයට සම්බන්ධ යැයි සලකනු ලබන්නාවූත් යෝජනාවක් මගින් හා ප්‍රකාශනයක් මගින් සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වෙත (මින් පසුව සමාගම යැයි හඳුන්වනු ලබන) ඉල්ලුම් කර සහ මින් පසුව දැක්වෙන උපලේඛනයේ විස්තර කරන රක්‍ෂණය සම්බන්ධයෙන් රක්‍ෂණ වාරිකය ගෙවා නැතහොත් ගෙවීමට එකඟවී ඇත.

රක්‍ෂණය කරන ලද කාලය තුල රක්ෂිතයා අනතුරු නිසා ඇති වූ කිසියම් ශාරීරික තුවාලයකින් පීඩා විඳින්නේ නම් එම තුවාල ඔහුගේ මරණයට හෝ ඔහු පූර්ණ ආබාධිතයෙකු බවට පත් කිරීමට හෝ අන් කිසිදු හේතුවක් නොවන තනි එක් හේතුවක් හෝ ස්වාධීන වූ එක් හේතුවක් හෝ වන්නේ නම්, මෙම රක්‍ෂණයේ උපලේඛනයේ දැක්වෙන පහත සඳහන් නියම, විධිවිධාන, කොන්දේසි, අර්ථදැක්වීම්, සීමා සහ මෙම ඔප්පුවේ පිටසන් යොදා සහතික කළ යමක් වේ නම් එය අනුව රක්ෂිතයාට වන්දි ගෙවීමට හෝ ඔහුගේ මරණයේ දී රක්ෂිතයාගේ නීතියාණුකූල නියෝජිතයා වෙත උපලේඛනයේ දැක්වෙන එම මුදල හෝ එම මුදල්වල එකතුව ගෙවනු ලබන බව දැන් මෙම ඔප්පුව සාක්ෂි දරයි.

මෙයට සාක්ෂි වශයෙන් සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වෙනුවෙන් 2019 වර්ෂ අගෝස්තු 13 දා කොළඹ දී මෙම ඔප්පුවට අත්සන් තබන ලදී.

Ceylinco Insurance Limited

සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
වෙනුවෙන් බලයලත් නිලධාරියාගේ අත්සන

Directors
* B.S.M. De Silva - Chairman * H.D.K.P. Alwis F.C.I.C. - Managing Director * Dr. W.C.J. Alwis * U. Witharana - A.C.A., M.B.A., F.C.M.A. - Deputy Managing Director
* R.A. Gunathilake * H.D.A.N.Perera * K.D.A.S.R. Arsakularatne-B.Com.(Hons.) * E.M.M.Boyagoda-M.B.A. * Dr.U.D.DeSilva-MBBS.,FD.,FOMT.,FAAD. * A.R.H.Fernando
* S.C.G. Guruge * M.D.E.A.G. Saparamadu - MPSc. * Dr. S.D. Wanigaratne - D.Clin.Psych., FBPsS. * C.P.A. Wijeyesekera * G.S. Sundararajan B.Eng. (Agri.)

## ආවරණ

ශාරීරික තුවාල - අන් කිසිදු හේතුවක් නිසා නොව ස්වාධීනව හා පූර්ණ වශයෙන් අනතුරු නිසා පමණක් සිදුවූ පහත සඳහන් සිද්ධියක් නිසා ඇතිවිය හැකි තුවාල.

| | | |
|---|---|---|
| ප්‍රයෝජන | ශාරීරික තුවාල ඇති වී මාස 12ක් ඇතුලත අනතුර නිසා සිදුවූ මරණය හෝ ස්ථිර අබාධය සිදු වීම. | හදිසි අනතුරු මරණ හෝ ස්ථිර ආබාධය පිළිබඳ වගුවේ වන්දියේ පරිමාණය දක්වා දක්වා ඇත |
| ප්‍රයෝජන | හදිසි නොවන මරණ - අවමංගල්‍ය වියදම් | රු. 100,000.00 |

## අර්ථ නිරූපණයන්

"ශාරීරික පීඩාව" යනුවෙන් අහඹු සිදුවීමක් නිසා ලෝකයේ කවර හෝ ප්‍රදේශයකදී හුදෙක් එක එල්ලේම රක්ෂිතයාට සිදුවන ශාරීරික පීඩාවක් අදහස් කෙරෙත අතර අසනීපයක්, රෝගයක් හෝ වෛද්‍ය ආබාධයක් නිසි සිදුවන ශාරීරික පීඩාව ඊට ඇතුලත් නොවේ.

## විශේෂ විධිවිධාන

1 සොයාගත නොහැකි වීම

රක්ෂිතයා අඛණ්ඩව මාස 12කට සොයා ගත නොහැකිවූවා නම් සමාගම මෙම රක්ෂණය යටතේ රක්ෂණය කරනු ලැබුවාවූ කිසියම් අනතුරකින් මරණය සිදුවූවා යැයි තීරණය කිරීමට සුදුසු පරිදි ඉදිරිපත් කල කිසියම් සාධක ගැන සොයා බැලුවේ නම් ඉහත පාඩු ඉල්ලීම සඳහා ගෙවීම් කළ පසු කිසියම් අවස්ථාවක රක්ෂිතයා ජීවත්වන්නේ යැයි දැනගනු ලැබුවා නම් එවිට මුලු මුදලම ආපසු ගෙවීමට සිදුවනු ඇත.

2 විවෘත අවස්ථාව:

මෙම රක්ෂණ ඔප්පුව මගින් ආවරණය කරනු ලැබූ අනතුරක දී රක්ෂිතයා අනිවාර්යයෙන්ම ස්වාභාවික මූලිකාංගවලට විවෘතවනවා ඇත.එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ඔප්පුවේ සඳහන් ආකාරයේ කිසියම් පාඩුවකට මුහුණ දුන්නේ නම්, එම සුවිශේෂ වූ පාඩුව මෙම ඔප්පුවේ කොන්දේසි ප්‍රකාරව ආවරණය කරනු ලබනවා ඇත.

## බැහැර කළ ඒවා (නිශේධ කළ ඒවා)

පහත සඳහන් ඒවායේ ඍජු හෝ වක්‍ර ප්‍රතිඵල හේතුවෙන් සිදු වූ වන්දි ඉල්ලීම්වලට සමාගම වගකියන්නේ නැත.

1. රක්ෂිතයා පහත සඳහන් ඒවාට දායකවනවා නම් හෝ යෙදෙනවා නම්:

a සන්නද්ධ හමුදා, මුහුදු හෝ ගුවන් හමුදා සේවයේ හෝ ක්‍රියාකාරකම්වල .

b පර්වත මත නැගීම නැතහොත් ලණු අවශ්‍ය වන්නාවූ කඳු නැගීම, එල්ලී ලිස්සා යෑම, උස් මුදුනක සිට පැනීම, පැරසූටයෙන් බිමට පැනීම, පයින් නොවන අන් ක්‍රමයකින් දිවීමේ තරග.

c. සාපරාධී ක්‍රියා හෝ කිසියම් නීතිවිරෝධී ක්‍රියා

2. රක්ෂිතයා කිසියම් මත්ද්‍රව්‍යය නිසා බලපෑමට லක් වී සිටි නම් එසේ මත්ද්‍රව්‍යය භාවිතා කරනු ලැබුවේ නීතියානුකූලව සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකුගේ නිර්දේශය මත මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමකට කරන ලද ප්‍රතිකාරයක් නිසා නොවන අවස්ථාවල වීම.

Ceylinco General Insurance Limited

3 කුපිත කරවනු ලැබීම නිසා කරන ලද ඝාතනයක් නොවීම. සිතාමතා තමාට තමාම තුවාළ කර ගැනීම. දිවි හානි කරගැනීම හෝ අන් එවැනි වෑයමක් සිහියෙන් හෝ අසිහියෙන් සිදුකිරිම.

4 මුල සිට පවතින ශාරිරික හෝ මානසික ආබාධයක් හෝ ඌනතාවයක්.

5. උවමනාවෙන්ම අනතුරකට මුහුණ දීම (මිනිස් ජිවිතයක් බේරා ගැනීම සඳහා නොවන අවස්ථාවක්)

6. කලකෝලහල හෙවත් සිවිල් ගැටුම්, යුද්ධය. ආක්‍රමණය. විදේශීය සතුරන්ගේ යුධමය ක්‍රියාකාරකම්. සටන් :එය ප්‍රකාශකරන ලද්දක් හෝ ප්‍රකාශ නොකරන ලද්දක් වුවද) ආදියට ඍජුව සම්බන්ධවීම සිවිල් යුද්ධ. කැරැල්ල. විප්ලවයස රජයට විරුද්ධ සටන් නැතහොත් හමුදාමය හෝ නීතියානුකුල නොවන ලෙස තනතුර අත්පත් කරගැනීම.

7. (කිසියම් ආයතනයක් වෙනුවෙන් පුද්ගලයකු හෝ පුද්ගලයන් නැතහොත් පුද්ගල කණ්ඩායම් වෙනුවෙන්) තනතුරෙන් පහ කිරිම සඳහා යොමු වූ හෝ නැතහොත් එයට යථාර්ථවාදිව හෝ යුක්ති යුක්තව පිහිටවූ රජයට බලපාන හෝ කිසියම් පළාත් හෝ දේශීය අධිකාරිය බලයෙන් හෝ ගිය ගැන්වීමෙන් හෝ ත්‍රස්තවාදයෙන් හෝ සාහසික ක්‍රියාවලින් ඉවත් කරන ක්‍රියාවක්

8. අයනීකාරණ විකිරණ හෝ න්‍යෂ්ටික විකිරණ හෝ න්‍යෂ්ටික ඉන්දන හෝ පරමාණු ඉන්ධන දහනයෙන් ඇතිවූ පරමාණු න්‍යෂ්ටික අපද්‍රව්‍යවලින් ඇති වූ විකිරණ පැතිරිම. මෙම බැහැර කිරිම සඳහා දහනයට ඇතුලත් වනුයේ කිසියම් ස්වයං පවතින්නාවූ ක්‍රියාවලියන් මගින් න්‍යෂ්ටික බණ්ඩනය

Ceylinco General Insurance Limited

මරණය හෝ ස්ථිර ඌනතාවයේදී ලබාදෙන සහන පිළිබඳ උපලේඛනය

| | | |
|---|---|---|
| 1 අනතුරු මරණය | පාරිභෝගිකයා විසින් තීරණය කරනු ලබන ප්‍රාග්ධන මුදල | 100% |
| 2 ස්ථිර ඌනතාවය | මෙයට යාකර ඇති ඔප්පුවේ උපලේඛනයේ දැක්වෙන පරිදි ප්‍රාග්ධන මුදලේ අනුපාතයන් | |
| ඌනතාවය පිළිබඳ විස්තර | | ප්‍රාග්ධන මුදලේ ප්‍රතිශතයන් |
| • අත් පා දෙකම නැතිවීම<br>• දෑත් හෝ සියලු ඇඟිලි හා මහපට ඇඟිලි යන සියල්ල නැතිවීම<br>• මුලුමනින්ම අක්‍රියවීම<br>• මුලුමනින්ම සිහිබුද්ධිය නැතිවීම<br>• සැමදා ඇඳේ ගතකිරීමට හේතුවන ආකාරයේ ඇති වන තුවාළ<br>• දෑස් සම්පූර්ණයෙන් අහිමිවීම<br>• ස්ථිර හා පූර්ණ වශයෙන් ආබාධවීමට හේතුවන වෙනත් කිසියම් තුවාළ | | 100% |
| • උර හිස මට්ටමින් දෑත් අහිමිවීම<br>• උර හිස හා වැළමිට අතරින් අත අහිමිවීම<br>• වැළමිට හා මැණික් කටුව අතරින් අත අහිමිවීම<br>• මැණික් කටුව අසලින් අත අහිමිවීම<br>• පාද අහිමිවීම | | 50% |

| | | |
|---|---|---|
| • ඇසක් අහිමිවීම | එක ඇසක පෙනීම සම්පූර්ණයෙන් අහිමිවීම | 50% |
| • ඇඟිලි හතරක් හා එක් අතක මහපට ඇඟිල්ල අහිමි වීම | | 50% |
| • කථන ශක්තිය අහිමි වීම | | 50% |
| **3** හදිසි නොවන මරණ - අවමංගල්‍ය වියදම් | රු. 100,000.00 | |

කිසියම් අනතුරක් සඳහා කරනු ලබන මුලු ගෙවීම 100% ඉක්මවන්නේ නැත. මුලු ගෙවීම 100% ගෙවනු ලැබූ විට මෙහි සියලු රක්ෂණයන්ම බල රහිත කෙරේ. 100% වඩා අඩු අනෙකුත් ගෙවීම් ප්‍රතිලාභ යටතේ ගෙවීම් කරනු ලැබුවා නම් එය අනතුර සිද්ධ වූ දින සිට ඔප්පුව අවසන් වන දින දක්වා අඩුකරනු ලැබේ.

## කොන්දේසි

මෙම ඔප්පුවේ හෝ උපලේඛනයේ කිසියම් ස්ථානයක දී කිසියම් වචනයකට හෝ ප්‍රකාශනයකට කිසියම් සුවිශේෂ අර්ථයක් දක්වා තිබුණි නම් එම වචනය සඳහන්වන සෑම ස්ථානයක දීම එම සුවිශේෂ අර්ථයම දරණවා ඇත. එහෙයින් මෙම ඔප්පුව හා උපලේඛනය එක් තනි ගිවිසුමක් වශයෙන් සළකා කියවිය යුතුය.

1. **දැන්වීම්**

සමාගමට ලබා දෙන සෑම දැනුම්දීමක් හෝ සමාගම සමග කරන සෑම සන්නිවේදනයක්ම ලිඛිතව සිදු කළ යුතුයි. මෙම ඔප්පුවේ කොන්දේසිවල කිසිම වෙනස් කිරීමක් හෝ එහි ඇති කිසිවක් හෝ පිටසනක් හෝ සමාගමේ බලයලත් නියෝජිතයකු විසින් කෙටි අත්සන් හෝ අත්සන් යොදා සහතික කර නොතිබුණි නම් එය වලංගු නොවන්නේය.

2. **අයිතිවාසිකමට මුල්වන කොන්දේසි**

රක්ෂිතයා විසින් මෙම ඔප්පුවේ කොන්දේසි, විධිවිධාන, ප්‍රතිපාදන ආදිය නිසි පරිදි ඉටුකිරීම හා සම්පූර්ණ කිරීම සහ එය යමක් කිරීම නැතහොත් රක්ෂිතයා නියමයට යටත්වීම සමාගමේ කිසියම් වගවීමට නිදර්ශනය වශයෙන් දැක්විය හැකිය.

Ceylinco General Insurance Limited

3. වැරදි තොරතුරු සැපයීම / වංචාකිරීම

කිසියම් කරුණක් සම්බන්ධයෙන් රක්ෂිතයා විසින් ඉදිරිපත් කර ඇති අදාළ යෝජනා හා ප්‍රකාශනය සත්‍ය නොවේ නම් නැතහොත් අවදානම සම්බන්ධව දක්වා ඇති භෞතික සාධක වැරදි ලෙස දක්වා ඇත්නම් නැතහොත් උවමනාවෙන්ම නොදන්වා අතහැර ඇත්නම් මෙම රක්ෂණ ඔප්පුව හෝ එහි කිසියම් අර්ථ කිරීමකදී වැරදි තොරතුරු ලබා දීමක් කර ඇත්නම් වැරදි නියෝජනයකින් හෝ වසන් කිරීමෙන් හෝ කරන ලද කිසියම් වන්දි ඉල්ලීමක් වංචා සහගත හෝ වැඩිකොට දක්වා ඇත්නම් සහ එයට සහයෝගය දැක්වීමක් වශයෙන් වැරදි ප්‍රකාශයක් හෝ කරුණු ඉදිරිපත් කිරීමක් කර ඇත්නම්. එවිට මෙම ඔප්පුව බලරහිත වන්නේය.

4 අවදානමේ වෙනස

රක්ෂිතයා ඔහුගේ හෝ ඇයගේ රැකියාව. වෙළදම. වගකීම හෝ ව්‍යාපාරය සම්බන්ධව ඇතිවන කිසියම් වෙනස්කම් පිළිබඳව වහාම ලිඛිතව දැනුම් දී ඒ සඳහා සමාගමට අවශය අමතර රක්ෂණ වාරිකය ගෙවිය යුතුය.

රක්ෂිතයා තමා ලක්වූ හා තමා දැනගත් තුවාළ. ආබාධ. රෝග. ශාරිරික දෝෂ. අඩුපාඩු පිළිබඳව ඔප්පුවේ සෑම අර්ථ කිරීමකටම ප්‍රථමයෙන්ම ලිඛිතව සමාගමට දැනුම් දිය යුතුය.

5 වන්දි ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන පිළිවෙළ මෙම ඔප්පුවෙන් අදහස් කරන පරිදි අනතුරකදී ඒ පිළිබඳ ලිඛිත දැනුම්දීම සමාගමට හැකි ඉක්මනින් ලබා දිය යුතුයි. එවැනි දැනුම් දීමක් සිද්ධිය සිදු වී දින හතක් ඇතුළත සමාගම නොලැබුවේ නම් ප්‍රමාදය සඳහා සාධරණ යුක්ති සහගත හේතු දැක්වීමට ඉඩ දෙනු ලැබ්. එසේ නොවූවිට එම වන්දි ඉල්ලීමට ඉඩ දෙනු නොලැබේ. කිසියම් සිද්ධියක් සිදුවී ලිත් මාස තුනක් තුළ ඒ පිළිබඳව සමාගමට දැනුම් දීමට අසමත් වුවහොත් ඒ පිළිබඳව වගකීම් දැරීමට සමාගම බැදී නැත. එහෙත් මරණයක් සම්බන්ධයෙන් නම් ඒ පිළිබඳව වහාම දැනුම් දිය යුතුය. හදිසි අනතුර සිදුවූ දින සිට උපරිම දින එකසිය අසූවක් ඇතුලත සමාගම ඉල්ලුම් කරන ආකාරයේ සියළුම සහතික. තොරතුරු හා සාක්ෂි රක්ෂිතයා තම වියදමින්ම ලබා දිය යුතු අතර ඒවා සමාගම ඉල්ලන අන්දමින් හා ආකාරයෙන් විය යුතුය. දින එකසිය අසූවක් ඇතුලත අදාල සහතික තොරතුරු, හා සාක්ෂි ලබා දීමට අපොහොසත් වුවහොත් එම රක්ෂණ වන්දි ලබා ගැනීමට නොහැකි වනු ඇත.

සමාගමේ වෛද්‍ය නිලධාරියා හෝ අනෙකුත් නියෝජිතයන් සාධරණවූ හා යුක්තිසහිත වූ සෑම අවස්ථාවකදීම සමාගමට අවශ්‍ය පරිදි රක්ෂිතයා හෝ රක්ෂිතයන් පරීක්ෂා කිරීමටත් හමුවීමටත් පහසුකම් ලබා දිය යුතුය. රක්ෂතයාගේ හෝ රක්ෂිතයන්ගේ මරණයේදී සමාගමේ වියදමින් මරණ පරීක්ෂණයක් පැවත්වීමට සමාගමට අයිතියක් ඇත. රක්ෂිතයා සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකු යටතේ ප්‍රතිකාර ලැබීම සඳහා ඇතුලත් නොවූයේ නම් ඔහුට හෝ ඔවුනට කිසිදු ආකාරයක රක්ෂණ වන්දි ලබා ගැනීමට නොහැකි වනු ඇත. මරණයකදී ගෙවනු ලබන වන්දි හැර මේ යටතේ කිසිදු සිද්ධියක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීමට මෙම ඔප්පුවේ බලය ලත් අයට අයිතියක් නැත.

6. අයිතිය පැවරිය නොහැකිවීම

මෙම රක්ෂණ ඔප්පුව සම්බන්ධව කරනු ලබන කිසිදු පැවරීමක් හෝ කැප අයිතියක් හෝ භාරය වෙනස් කිරීමක් හෝ සමාගම පිළිගන්නේ හෝ සමාගමට බලපාන්නේ හෝ නැති අතර මෙම ඔප්පුව පැවරීම් කිරීම ද කළ නොහැක්කකි. සමාගමට රක්ෂිතයා හෙවත් ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලික නියෝජිතයා හෝ දිය යුතු ලැබීමක් හෝ ණය ගෙවීමක් හෝ මෙම ඔප්පුව යටතේ කිසියම් ප්‍රාග්ධන ගෙවීමක් හෝ වන්දියක් හෝ වේ නම් එය අවසාන හා පූර්ණ එකක් බව සළකන අතර එය සමාගමේ කිසියම් හෝ සෑම අවසාන හා සියළුම තුවාළ හෝ සම්භාව්‍යතවය සඳහාවූ (මරණය ඇතුලුව) සම්පූර්ණ වගකීමක් වනු ඇත. එය අනතුරේ ප්‍රතිඵලය වශයෙන් අදාළ ගෙවීම් හෝ ලැබීම් ලද දිනයට හෝ පසුව සිදුවූවද මෙය වලංගුය.

Ceylinco General Insurance Limited

## 7. අවලංගු කිරීම

සමාගම මෙම ඔප්පුව අවසන් කරන්නේ නම් ඒ පිළිබඳ සිය කැමත්ත දවස් හතක කල් ඇතිව රක්‍ෂණය වලංගුව පැවති කාලය සඳහා ගෙවන ලද රක්‍ෂණ වාරිකයෙන් කිසියම් අනුපාතයක් ඉල්ලුම් කළවිට ගෙවන පදනම මත රක්‍ෂතයාගේ අවසන් වරට දන්නා ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව දැන්විය යුතුයි. එවැනිම දැනුම් දීමකින් රක්‍ෂිතයා ඕනෑම අවස්ථාවක මෙම ඔප්පුව අවලංගු කළ හැකිය. එසේ වූ විට සමාගම ඔප්පුව බලයේ පැවැති කාල සීමාව සඳහා වූ සාමාන්‍ය කෙටි කාලීන රක්‍ෂ වාරික ගෙවීමක රුඳවුම් මුදලක් රඳවා ගනියි.

## 8. නඩු කටයුතු

මෙම රක්‍ෂණ ඔප්පුවේ අවශ්‍යතාවය අනුව අලාභය පිළිවඳ ලිඛිත ඔප්පු කිරීම ඉදිරිපත්කර දවස් 60ක් අවසන් වීමට ප්‍රථම මෙම ඔප්පුවෙන් ආපසු ලබා ගැනීමට කිසියම් නීති මාර්ගික කටයුත්තක් හෝ සාධරණ පදනම මත ඉල්ලීම් හෝ කළ නොහැකිය. අලාභය පිළිබඳ ලිඛිත ඔප්පු කිරීම ලබා දිය යුතු දිනයෙන් අවුරුද්දක කාලයක් ගත වූ පසු එම අලාභය පිළිබඳ ඉල්ලීම් ඉදිරිපත් කළ නොහැකිය.

## 9 බේරුම්කිරීම

රක්‍ෂණ ඔප්පුව පිළිබඳව ඇතිවිය හැකි සියලුම මතභේද සමථයකට පත්කිරීමට එම කරුණු සියල්ල මතභේදයට මුහුණ දුන් පාර්ශ්වයන් විසින් ලිඛිතව පත් කළ බේරුම්කරුවෙකුගේ තීරණය සඳහා ඉදිරිපත් කළයුතුය. පාර්ශ්වයන්ට තනි එක් බේරුම්කරුවෙකු සම්බන්ධයෙන් එකාග විය නොහැකි අවස්ථාවකදී. ඒ පිළිබඳව එක් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වයකට ලිඛිත දැනුම් දුන් පසුව ලිත් මාසයක් ඇතුළත එක් පාර්ශ්වයක් එක් බේරුම්කරුවෙකු බැගින් අපක්‍ෂපාත බේරුම්කරුවන් දෙදෙනකු පත්කළ හැකිය. ඒ පිළිබඳ ලිඛිත දැනුම් දීම ලැබී ලිත් මාසයක් ඇතුළත කිසියම් අවස්ථාවක ඕනෑම පාර්ශ්වයක් මැදිහත්කරුවකු පත්කිරීමට අකැමත්තේ නම් හෝ ප්‍රතික්ෂේප කළේ නම් හෝ එවිට අනෙක් පාර්ශ්වයට තනි එක් බේරුම්කරුවෙකු පත් කළ හැකිය. එසේම එම මැදිහත්කරුවන් අතර කිසියම් එකගතාවයට පැමිණිය නොහැකි අවස්ථාවක දී ඔවුන් විසින් ඊට කලින් ලිඛිතව පත්කර ගන්නා තීරකවරයෙකුගේ තීරණයට එම කරුණ ඉදිරිපත් කළ යුතුය. ඔහු සභාපති වශයෙන් බේරුම්කරුවෙන් සමග වාඩිවනු ඇත. එසේම කිසියම් පාර්ශ්වයකගේ අභාවය බේරුම්කරුවන්ගේ හෝ මැදිහත්කරුවකුගේ හෝ අධිකාරිය හෝ බලය නිශ්ප්‍රභව කරන්නනේ නොවනු ඇත. එසේම බේරුම්කරුවන්ගේ හෝ මැදිහත්කරුවකුගේ මරණයකදී අවශ්‍ය පරිදි ඔහු වෙනුවෙන් ඔහු පත් කළ පාර්ශ්වය විසින් තවත් පුද්ගලයෙකු පත් කළ හැකිය. මෙම මැදිහත්කරුවන් හා බේරුම්කරුවන් මෙහි දී එකට වාඩි වී තීන්දුව ලබා දෙන්නන් වන අතර මෙහිදී විශේෂයෙන් ගිවිසගෙන ප්‍රකාශ කරන ලද මෙම ඔප්පුවේ කොන්දේසියක් වනුයේ මැදිහත්කරුවන් හා බේරුම්කරුවන් සඳහා කිසියම් දීමනාවක් වේ නම් එය ප්‍රථමයෙන් ලබා ගත යුතුය යන්නය. සමගම මෙහි අඩංගු විධිවිධාන යටතේ රක්‍ෂිතයාගේ කිසියම් වන්දි ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන්නේ නම් එම ප්‍රතික්ෂෙපය ඉල්ලුම්කරු එම වන්දි ඉල්ලීම බේරුම්කිරීම සඳහා ඉදිරිපත් කර ලිත් මාස 12ක් තුළ කරන ලද්දක් නොවිය යුතුය. එසේ වූවිට එම ඉල්ලීම සියලු ආකාරයෙන්ම අත්හළ එකක් ලෙස සලකනු ලබන අතර ඉන්පසුව එය මේ යටතේ ලබාගතහැකි එකක් නොවනු ඇත.

Ceylinco General Insurance Limited

## 10. වාරිකය පිළිබඳ පොරොන්දුව

මෙම රක්‍ෂණ ඔප්පුව / පිටසත් කිරීම / අලුත් කිරීමේ සහතිකය ආරම්භ කරන දිනයේ සිට දින හතක් (07)ක් ඇතුලත නියමිත වාරිකය ගෙවිය යුතු බවත් සමාගම විසින් එය බාරගත යුතු බවත් මෙම රක්‍ෂණ ගිවිසුමේ ඇති මූලික පූර්ණ විශේෂ කොන්දේසියක් වන්නේය. මෙම කොන්දේසියට අනුකූලව කටයුතු නොකරන්නේ නම් එවිට මෙම ගිවිසුම ඉබේම අවලංගු වන අතර සමාගම අවදානම දරා තිබෙන කාලපරිච්ඡේදය වෙනුවෙන් ප්‍රමාණානුකූල වාරිකයක් ලබාගැනීම සඳහා හිමිකම් ලබන්නේය. මෙම පොරොන්දුව අනුව ගෙවිය යුතු වාරිකය සමාගමේ බලයලත් නියෝජිතයකු විසින් බාරගෙන ඇති අවස්ථාවක මෙම පොරොන්දුවේ කාර්‍යයන් සඳහා සමාගම විසින් එම ගෙවීම බාරගෙන ඇති ලෙස සලකනු ලබන අතර ගෙවිය යුතු වාරිකය බාරගැනීමට බලය පවරා නොතිබූ රක්‍ෂණ නියෝජිතයකු ඇතලුව පුද්ගලයකු විසින් බාරගෙන ඇති බව ඔප්පු කිරීමේ වගකීම මෙම රක්‍ෂණ ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි වලට අන්‍යාකාරයෙන් යටත්ව සමාගම වෙත පැවරෙන්නේය.

### වැදගත්

රක්‍ෂිතයා මෙම රක්‍ෂණ සහතික පත්‍රය සැලකිල්ලෙන් කියවිය යුතුයි. මෙහි කිසියම් අඩුපාඩු හෝ වැරදි පහදාදීම් වූවානම් නැතහොත් ආවරණය රක්‍ෂිතයාගේ කැමැත්තට එකාග නොවූවා නම් ඒ පිළිබඳව සමාගමට වහාම දැනුම් දිය යුතුයි. තවද ඔප්පුව පරීක්‍ෂාව සඳහා ආපසු ලබා දිය යුතුයි .

Ceylinco General Insurance Limited

## උපලේඛනය

ඔප්පු අංකය : CO0116AP0005463

රක්ෂිතයා :

නම : Dialog Axiata PLC

ලිපිනය : අංක 475 යුනියන් පෙදෙස කොළඹ 02

ව්‍යාපාරය /වෘත්තිය : විදුලි සංදේශ සේවා සැපයුම්කරු

රක්ෂිත පුද්ගලයා / පුද්ගලයින්

රක්ෂිත ජීවිත :

ඩයලොග් ඇක්සියාටා පීඑල්සී මගින් සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් වෙත මාසිකව ප්‍රකාශ කරනු ලබන එස්. එම්. එස්. මගින් ලියාපදිංචි වන ඩයලොග් පෙර ගෙවුම් හා පසු ගෙවුම් පාරිභෝගිකයින්

මෙම රක්ෂණය අමුණා ඇති දේශපාලන අවදානම් බැහැර (Political Risks Exclusion Clause) හා සයිබර් වගන්තිය (Cyber Clause) වන පිටසන් වලට යටත්වේ.

| | | |
|---|---|---|
| **රක්ෂණ ඔප්පු කාලයඃ අවුරුදු 01** | 01.09.2019 | 01.09.2020 |

භූගෝලීය සීමාව : ශ්‍රී ලංකාව තුල පමණයි

ප්‍රාග්ධන මුදල හා ප්‍රතිලාභ (එක් රක්ෂිතයෙකුට)

ප්‍රතිලාභ (අ) : හදිසි මරණ හා ස්ථිර ආබාධ

ප්‍රාග්ධන මුදල රුඃ 500,000/-, රුඃ 1,200,000/-, රුඃ 2,400,000/- හා උපරිම රුඃ 5,000,000/- රක්ෂණ යෝජනා ක්‍රමය අනුව හා උප ලේඛනයේ සඳහන් රක්ෂිතයන්ගේ වාරිකය අනුව වෙනස්වේ).

ප්‍රතිලාභ (ආ) : හදිසි නොවන මරණ : අවමංගල්‍ය වියදම් - රුඃ 100,000.00

වයස් සීමාව : අවුරුදු 18 සිට අවුරුදු 70 දක්වා

සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
වෙනුවෙන් බලයලත් නිලධාරියාගේ අත්සන

# PREMIUM PAYMENT WARRANTY

1. Notwithstanding anything herein contained but subject to clause 2 and 3 hereof, it is hereby agreed and declared that the full premium due and payable in respect of this insurance is required to be settled to the Insurer (The Company) on or before the premium due date specified in the Schedule of this Policy, Renewal Certificate, Endorsement or Cover Note (which shall be a date not exceeding 60 days from the date of inception of the policy) and in the absence of any such premium due date, the full settlement of the premium is required to be made or effected on or before the expiry of the 60$^{th}$ day from the date of inception of this Policy, Renewal Certificate, Endorsement or Cover Note (hereinafter referred to as the "due date").

   For the purpose of this warranty the "due date" shall be recognized from the date of inception or commencement of the coverage.

2. It is also declared and agreed that the settlement of the full premium on or before the due date shall operate as a condition precedent to the insurer's (The Company's) liability or an obligation to settle a claim under this Policy, Renewal Certificate, Endorsement or Cover Note.

   In the event any claim arises between date of commencement of this insurance and the "due date" for the settlement of premium, the insurer (The Company) may defer any decision on liability or postpone the settlement of any such claim until full settlement of the premium is effected on or before the "due date".

3. It is also declared and agreed that where the full premium payable hereunder remains outstanding as at the closure of business of the insurer on the "due date", then the cover under this insurance and any obligations assumed or imputed under this insurance shall stand to be cancelled, ceased and revoked immediately.

   However such cancellation will not prejudice the rights of the insurer (The Company) to invoke any legal defenses or to recover the full or any part of the defaulted premium attributable to the expired period of the insurance.

Subject otherwise to the terms, conditions and exceptions of the policy.

**CEYLINCO GENERAL INSURANCE LTD**

**Authorised Officer**

## Political Risks Exclusion Endorsement

Notwithstanding any provision to the contrary within this insurance or any endorsement thereto it is agreed that this insurance excludes loss, damage, cost or expense of whatsoever nature directly or indirectly caused by, resulting from or in connection with any of the following regardless of any other cause or event contributing concurrently or in any other sequence to the loss:

1. War, invasion, acts of foreign enemies, hostilities or warlike operations (whether war be declared or not), civil war. Permanent or temporary dispossession resulting from confiscation, commandeering or requisition by any lawfully constituted authority. Mutiny, civil commotion assuming the proportions of or amounting to a popular rising, tribal rising, military rising, insurrection, strike, riot, rebellion, revolution, military or usurped power, martial law or state of siege or any of the events or causes which determine the proclamation or maintenance of martial law or state of siege;

2. Any act of terrorism.

   For the purpose of this endorsement an act of terrorism means an act, including but not limited to the use of force or violence and/or the threat thereof, of any person or group(s) or persons whether acting alone or on behalf of or in connection with an organization(s) or government(s), committed for political, religious, ideological, or ethnic purposes or reasons including the intention to the influence any government and/or to put the public, or any section of the public, in fear.

This endorsement also excludes loss, damage, cost or expenses of whatsoever nature directly or indirectly caused by, resulting from or in connection with any action taken in controlling, preventing, suppressing or in any way relating to (1) and/or (2) above.

This endorsement shall be paramount and shall override anything contained in this insurance inconsistent therewith. However, if the Insured has obtained Riots & Strike and Terrorism cover by payment of the additional premium, the coverage granted will be subject to the relevant endorsements attached and any liabilities whatsoever under such specific extensions shall be devolved solely upon the Ceylinco General Insurance Ltd.

Subject otherwise to the terms, conditions and exceptions of the within written policy.

**CEYLINCO GENERAL INSURANCE LTD**

Ceylinco General ... Limited

Authorized Officer

## RADIOACTIVE CONTAMINATION, CHEMICAL, BIOLOGICAL, BIO-CHEMICAL AND ELECTROMAGNETIC WEAPONS EXCLUSION CLAUSE

This clause shall be paramount and shall override anything contained in this insurance inconsistent therewith.

1. In no case shall this insurance cover loss damage liability or expense directly or indirectly caused by or contributed to by or arising from.

   1.1 ionising radiations from or contamination by radioactivity from any nuclear fuel or from any nuclear waste or from the combustion of nuclear fuel.

   1.2 the radioactive, toxic, explosive or other hazardous or contaminating properties of any nuclear installation, reactor or other nuclear assembly or nuclear component thereof.

   1.3 any weapon or device employing atomic or nuclear fission and/or fusion or other like reaction or radioactive force or matter.

   1.4 the radioactive, toxic, explosive or other hazardous or contaminating properties of any radioactive matter. The exclusion in this sub-clause does not extend to radioactive isotopes, other than nuclear fuel, when such isotopes are being prepared, carried, stored or used for commercial, agricultural, medical, scientific or other similar peaceful purposes./;

   1.5 any chemical, biological, bio-chemical release or exposure of any kind, or electromagnetic weapon.

## CYBER ATTACK EXCLUSION CLAUSE

1.1 Subject only to clause 1.2 below, in no case shall this insurance cover loss damage liability or expense directly or indirectly caused by or contributed to by or arising from the use or operation, as a means for inflicting harm, of any computer, computer system, computer software programme, malicious code, computer virus or process or any other electronic system.

1.2 Where this clause is endorsed on policies covering risks of war, civil war, revolution, rebellion, insurrection, or civil strike arising therefrom, or any hostile act by or against a belligerent power, or terrorism or any person acting from a political motive, Clause 1.1 shall not operate to exclude losses (which would otherwise be covered) arising from the use of any computer, computer system or computer software programme or any other electronic system in the launch and/or guidance system and/or firing mechanism of any weapon or missile

**CEYLINCO GENERAL INSURANCE LTD**

AUTHORISED OFFICER